මගේ අංකය - AB/3B/EB EXAMS/2025/ASC II - EB I
ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
රේගු මන්දිරය
අංක 40, කෙළින් වීදිය
කොළඹ 11.

2025 සැප්තැම්බර් මස 19 දින

සහකාර රේගු අධිකාරී II ශ්‍රේණියේ සියලු නිලධාරීන් වෙත,

**ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරීවරුන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගය – 2020 II (2025)**

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත/කාර්යාලගත - ඛණ්ඩ II නිලධර ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටියේ 8 ඡේදය දක්වා ඇති පරිදි II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරීවරුන් සඳහා පැවැත්වෙන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2020 II (2025), **2025 දෙසැම්බර් මාසයේදී** (විභාග කොමසාරිස් ජනරාල් විසින් නියම කරනු ලබන දිනකදී) විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

- අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ " Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/E.B Exam" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online ) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2025 සැප්තැම්බර් මස 26** වැනි දින පෙ.ව. 09.00 ට විවෘත වන අතර **2025 ඔක්තෝබර් මස 17** වැනි දින රාත්‍රී 09.00ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමුකළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමඟ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතුය.

02. සුදුසුකම් : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවේ II ශ්‍රේණියේ සහකාර රේගු අධිකාරී තනතුරු දරන නිලධාරීන් හට අයදුම් කළ හැක.

03. විභාග පරිපාටිය - විභාගය සඳහා පහත සඳහන් විෂයන් ඇතුළත් වේ.

| | |
|---|---|
| I | ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම |
| II | මුදල් රෙගුලාසි හා ගිණුම් ක්‍රම |
| III | ඉංග්‍රීසි භාෂාව |
| IV | පරිගණක භාවිතය |

නිර්දේශ පත්‍රිකාව - පහත සඳහන් විෂය කරුණු පිළිබඳ අපේක්ෂක/අපේක්ෂිකාවන්ගේ දැනුම පරීක්ෂා කරනු ලැබේ.

**(I) ආයතන සංග්‍රහය හා කාර්යාල ක්‍රම (පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.)**

රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම හා ආයතන සංග්‍රහයේ පරිච්ඡේද: (I), (II), (IV), (V), (VII), (VIII), (XII), (XIII), (XIV), (XV), (XVI), (XVII), (XXI), (XXIII), (XXIV), (XXV), (XXVII), (XXVIII), (XXXII), (XXXIII) පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

**(II) මුදල් රෙගුලාසි හා ගිණුම් ක්‍රම (පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.)**

පහත සඳහන් විෂයන් ගැන දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

**IV පරිච්ඡේදය - ලැබීම්**

1 වැනි කොටස - මුදල් භාර ගැනීම
2 වැනි කොටස - මුදල් එකතු කිරීම
3 වැනි කොටස - මුදල් ප්‍රතිග්‍රහණය

**V පරිච්ඡේදය - ගෙවීම්**

2 වැනි කොටස - වවුචර් පිළියෙල කිරීම - මු.රෙ. 225
3 වැනි කොටස - සහතික කිරීම - මු.රෙ. 245
4 වැනි කොටස - වවුචර් වලට ගෙවීම - මු.රෙ. 255

**VI පරිච්ඡේදය - ආණ්ඩුවේ මුදල් යනාදියේ භාරකාරත්වය අග්‍රිම හා බැංකු ගිණුම**

2 වැනි කොටස - උප පත්‍රිකා පොත් - මු.රෙ. 340
4 වැනි කොටස - අග්‍රිම - මු.රෙ. 365
5 වැනි කොටස - බැංකු ගිණුම් - මු.රෙ. 380

**XII පරිච්ඡේදය - මුද්‍රණය හා ප්‍රකාශනය**

2 වැනි කොටස - මුද්‍රිත පෝරම සහ පොත් බැඳීම සඳහා ඇනවුම් - මු.රෙ. 640
3 වැනි කොටස - ප්‍රකාශිත මුද්‍රණය හා බෙදා හැරීම - මු.රෙ. 651
5 වැනි කොටස - ප්‍රවෘත්ති පත්‍ර නිවේදන සහ දැන්වීම් - මු.රෙ. 675

**XIII පරිච්ඡේදය - සැපයුම් වැඩ හා සේවා**

3 වැනි කොටස - භාණ්ඩවල භාරය හා හරි වැරදි බැලීම - මු.රෙ. 750
4 වැනි කොටස - වැඩිමනත් භාණ්ඩ හා පාවිච්චි කළ නොහැකි භාණ්ඩ - මු.රෙ. 767

**XIV පරිච්ඡේදය - විවිධ කරුණු**

4 වැනි කොටස - රාජකාරි දුරකථන - මු.රෙ. 845
5 වැනි කොටස - ප්‍රවෘත්ති පත්‍ර මිලයට ගැනීම - මු.රෙ. 855
9 වැනි කොටස - ව්‍යවස්ථාපිත අරමුදල් යනාදිය - මු.රෙ. 875

**(III) ඉංග්‍රීසි භාෂාව (පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.)**

ඉංග්‍රීසි භාෂාවේ නිවැරදි ව්‍යාකරණ භාවිතය, අදහස් ප්‍රකාශ කිරීම, වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ හැකියාව පරීක්ෂා කෙරේ.

**(IV) පරිගණක භාවිතය (පැය 02 ක ප්‍රශ්න පත්‍රයකි.)**

මයික්‍රොසොෆ්ට් ඔෆිස්, වර්ඩ්, එක්ස්සෙල්, ඇක්සස් සහ පවර්පොයින්ට් (Microsoft Office, Word, Excel, Access, Power Point) යන පරිගණක ක්‍රමවේද සහ අන්තර්ජාලය සහ විද්‍යුත් තැපැල (Internet and E-Mail) පිළිබඳ දැනුම සහ ප්‍රායෝගික භාවිතය පිළිබඳව පරීක්ෂා කෙරේ.

**සටහන:-** එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා හිමි මුළු ලකුණු සංඛ්‍යාව 100 කි. මෙම විභාගය සමත් වීමට එක් එක් විෂයයෙන් අවම වශයෙන් ලකුණු 40ක් ලබා ගැනීම අවශ්‍ය වන අතර, විෂයයන් හතරම එකවර සමත් වීම හෝ එක් එක් අවස්ථාවන්හිදී එක් එක් විෂයයෙන් සමත්වීම සහ අවසන් වශයෙන් නියමිත කාලය තුළදී විෂයන් 04 න්ම සමත් වීම ප්‍රමාණවත් වේ.

04. මෙම විභාගය සඳහා සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවෙන් පෙනී සිටිය හැකිය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

4

05. (I) මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපැලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදු කරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(II) ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් - ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

06. මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවා ඇති නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. තව ද විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් විසින් විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේදීම විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රවේශ පත්‍රයක් නොමැතිව විභායට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2025 ඔක්තෝබර් මස 17** දිනට හෝ ඊට ප්‍රථම තම අංශ ප්‍රධානීන් මාර්ගයෙන් මානව සම්පත් කළමනාකරණ අංශයට එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන කවර අයදුම්පතක් වුව ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර හෝ නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරනු ඇත. නිවේදනය පළවී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම්, දැන්වීමෙ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පතේ පිටපත සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේනොත් කල් වේලා ඇතිව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

09. අනන්‍යතාව :-

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය

III. ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කරගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

10. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

11. අයදුම්පතේ විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතුය.

12. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයන්ගෙන් පහත සඳහන් පදනම මත ගාස්තු අය කරනු ලැබේ.

විභාග ගාස්තු

(අ) පළමු වතාවට අයදුම් කිරීමේදී (සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා) — ගාස්තු අය නොකෙරේ.

(ආ) ඉන්පසු එක් එක් වතාවට එක් විෂයයක් සඳහා — රු. 250.00

විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදුකළ යුතුය.

i ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින් (Any Bank Credit Card)

ii අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card with the Facility of Internet Transactions)

iii ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මඟින් ( Online Banking Method of Bank of Ceylon)

iV ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් (Any Branch of the Bank of Ceylon)

සටහන :-

(අ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(ආ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

13. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

ශ්‍රීනි කරුණාරත්න
අතිරේක රේගු අධ්‍යක්ෂ ජනරාල් (මානව සම්පත්)
රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට